**දොම්පෙ ප්‍රාදේශීය සභාව - 2020**

-------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

------------------

1.1 **තත්ත්වාගණනය කළ මතය**

-----------------------------

දොම්පෙ ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට දොම්පෙ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

--------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 **විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

-----------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ  කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**------------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ. .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතා අනුව ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබූ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

1.6.1 **පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 3.6 | ප්‍රවර්තන මූල්‍ය ප්‍රකාශන කාල පරිච්ඡේදයේ ඉදිරිපත් කර ඇති සියළුම වටිනාකම් සඳහා පෙර වූ සමාන කළහැකි කාලපරිච්ඡේදය සම්බන්ධ සැසඳියහැකි තොරතුරු තුලනාත්මකව හෙළිදරව්කර නොතිබුණි. | | |
| 10.22 | 2019 දෙසැම්බර් 24 දිනැති අංක 2155/8 දරන අති විශේෂ ගැසට්පත්‍රයේ අංක 227(vi) පරිදි ගිණුම් කාල පරිච්ඡේදය තුලදී අයකරගත නොහැකි හුවමාරු ගණුදෙනුවලින් ලැබියයුතු දෑ ලියාහැරියේ නම් වටිනාකම හා ලියාහැරීම අනුමත කළ අධිකාරිය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළයුතු වුවත්, ලියාහැරතිබූ ලැබියයුතු දේපල ණය පොලී රු.278,766 ක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් නොකිරීම. | 2021 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරීමේදී කරුණු හෙළිදරව් කරන බව දන්වමි. | මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතු වේ. |
| 11.10 | අසම්භාව්‍ය වගකීම් පිළිබඳව හෙළිදරව් කළයුතු වුවත් කළුගල් ව්‍යාපාරිකයෙකු 2020 නොවැම්බර් 12 දින සභාවට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරා තිබූ නඩු පිළිබඳව හෙළිදරව්කර නොකිරීම. | | |

1. 6.2 **ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී මිලදීගත් රු.6,549,083 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 07 ක් මුදල් පොත බැර කර වියදමට හර කර තිබූ අතර එම වත්කම් ප්‍රාග්ධනිත කිරීම සඳහා වත්කම් ගිණුම් හර කර වියදමට බැර කළයුතු වුවත් ජර්නල් අංක 37 මගින් වත්කම් ගිණුම් හරකර ප්‍රත්‍යාගණන ගිණුමට බැර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තාවෙන් නිවැරදි කරමි. | ස්ථාවර වත්කම් නිවැරදිව ප්‍රාග්ධනිත කළ යුතු වේ. |
| (ආ) | හිඟහිටි කඩකුලී හා හිඟ වෙළඳ ස්ථාන කුලී සඳහා අයකල දඩ මුදල් පිළිවෙලින් රු.7,210 ක් හා රු.77,874 ක් හිඟහිටි කුලී ගිණුම හරකර අධිගාස්තු ආදායම් ගිණුමට බැරකළයුතු වුවත්, අධිගාස්තු වියදම් ගිණුමකට හරකර හිඟහිටි කුලී ගිණුම්වලට බැරකර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ හිඟ කුලී රු.77,874 කින් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තාවෙන් නිවැරදි කරමි. | ගිණුම්වල අඩුවෙන් දැක්වීම නිවැරදි කළයුතු වේ. |
| (ඇ) | හිඟ ටෙන්ඩර් කුලී සඳහා අයකළ අධිගාස්තු රු.74,701 ක් හිඟහිටි ටෙන්ඩර් කුලී ගිණුම හරකර අධිගාස්තු ආදායම් ගිණුමට බැර කළයුතු වුවත්, හිඟහිටි ටෙන්ඩර් කුලී ගිණුම බැරකර අධිගාස්තු වියදම් ගිණුමට හර කිරීම හේතුවෙන් හිඟහිටි ටෙන්ඩර් කුලී එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තාවෙන් නිවැරදි කරමි. | හිඟහිටි ටෙන්ඩර් කුලී ගිණුම් අඩුවෙන් දැක්වීම නිවැරදි කළයුතු වේ. |
| (ඈ) | ඉදිරි වර්ෂය සඳහා වරිපනම් ලැබීම් රු.911,337 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වරිපනම් ආදායම රු.911,337 ක් වැඩියෙන් හා හිඟහිටි වරිපනම් බදු ආදායම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තාවෙන් නිවැරදි කරමි. | ගිණුම් නිවැරදි කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් පොදු ගබඩා තොගයෙන් ඉවත් කරන ලද රු.48,469 ක තොගයක් පොදු ගබඩා තොග ගිණුම බැර කර තොග අපහරණ ගිණුමට හර කළයුතු වුවත්, තොග ගිණුම හර කර වියදමට බැරකර තිබුණි. මේ හේතුවෙන් පොදු ගබඩා තොග ගිණුම රු.48,469 කින් වැඩියෙන් ද වියදම අඩුවෙන් ද දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තාවෙන් නිවැරදි කරමි. | තොග ගිණුම් නිවැරදි කළයුතු වේ. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය තුල ලැබී තිබුණු රු.108,362,123 ක් වූ ප්‍රාග්ධන ප්‍රදානවලින් වර්ෂයට අදාල ප්‍රමාණය අදාල ක්ෂය ප්‍රතිශතයට ගණනය කළවිට රු.10,836,212 ක්, පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් වන පැවරුම් ගිණුමට මාරු කළයුතු වුවත්, මුළු මුදලම එකී ගිණුමට මාරුකර තිබූ අතර ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.97,529,911 කින් වැඩියෙන් පෙන්නුම්කර තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තාවෙන් නිවැරදි කරමි. | ගිණුම් නිවැරදි කළයුතු වේ. |
| (උ) | ඉකුත් වර්ෂයේ සිට පැවත එන රු.2,977,000 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තාවෙන් නිවැරදි කරමි. | අවිනිශ්චිත ගිණුමේ ශේෂය ඇතිවීමට හේතු පරීක්ෂා කර නිවැරදි කළයුතු වේ. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේදී ආපදා කළමනාකරණ ඒකකයෙන් පරිත්‍යාග වශයෙන් ලද රු.850,554 ක් වූ ස්ථාවර වත්කම් වටිනාකමෙන් ක්ෂය ප්‍රතිශතයට හඳුනාගන්නා ලද ආදායම රු.94,909 ක් ආදායමට බැරකර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය සමාන වටිනාකමකින් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තාවෙන් නිවැරදි කරමි. | අවශ්‍ය ගැලපීම් කර නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. |
| (එ) | සමාලෝචිත වර්ෂයේ දරන ලද ප්‍රාග්ධන වියදම් රු.148,551,446 ක්, වත්කම් ගිණුම් වලට හා වැඩ අවසන් නොවූ ව්‍යාපෘති කෙරීගෙන යන වැඩ ගිණුමකට හර කළයුතු වුවත්, මුළු මුදලම වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගතකර තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තාවෙන් නිවැරදි කරමි. | කෙරීගෙන යන වැඩ මගින් ගිණුම් නිවැරදි කිරීම කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක ස්ථාවර වත්කම් මුළු වටිනාකම රු.1,749, 948,436 ක් සඳහා වූ වාර්ෂික ක්ෂය රු.37,558,615 ක්, වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගතකර නොතිබීම හේතුවෙන් අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තාවෙන් නිවැරදි කරමි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ක්ෂය ගිණුම නිවැරදි කළයුතු වේ. |

1.6.3 **නොසැසඳු පාලන ගිණුම්**

--------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.48,358,359 ක් වූ ගිණුම් විෂයයන් 02 කට අදාල උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.18,240,268 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2021 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමේදී නිවැරදි කරමි. | වෙනසට හේතු සොයාබලා නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. |

2. **මූල්‍ය සමාලෝචනය**

------------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.187,187,134 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,560,194 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

----------------------

2.2.1 **වරිපනම් හා බදු**

---------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අගෝස්තු 25 දිනැති හා අංක 1493 දරන ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයම දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කර තිබුණද , 2020 වර්ෂය වන විට වරිපනම් අයකර තිබුණේ මුළු දේපල 10729 කින් පමණක් බවත්,<br>2020 දෙසැම්බර් 31 දිනට පැවති රු.7,257,081 ක හිඟ වරිපනම් | දොම්පෙ බල සීමාව දියුණු ගම් ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇතත් ඉතා දිළිඳු හා අඩු පහසුකම් සහිත ප්‍රදේශ බහුලව ඇති බැවින් සමස්ථ බල ප්‍රදේශය සඳහාම වරිපනම් බදු පැනවීම සිදු කිරීමට මහ සභාවේ අනුමැතිය ලැබී නැත. ඒ අනුව අදියර කිහිපයක් යටතේ වරිපනම් බදු පැනවීමට කටයුතු කරමින් පවතී.<br>2020.12.31ට පැවති හිග මුදලින් මේ වන විට රු 1,992,936 ක් අයවී ඇති අතර, අය කරගත නොහැකි දේපල | ගැසට් පත්‍රය ප්‍රකාරව වරිපනම් බදු පැනවීමට සහ හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළයුතු වේ. |

| | | |
|---|---|---|
| ශේෂයෙන්, 2022 ජනවාරි 31 දින වන විට, කාලවිශ්ලේෂණය අනුව, හිඟ වරිපනම් ශේෂය වර්ෂ 5-10 ත් අතර රු.39,364 ක් ද, වර්ෂ 3-5 ත් අතර රු.179,375 ක් ද, වර්ෂ 1-3 ත් අතර රු.1,265,481 ක් ද අය කර ගැනීමට කටයුතු කර නොතිබුණ බවත්, නිරීක්ෂණය විය. | කිහිපයක මුදල වන රු.160,383 ක මුදලක් කපා හැරීමට ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කර ඇත. | |

2.2.2 **වෙනත් ආදායම්**

------------------

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ පිහිටි දුරකථන කුළුණු 37 කින් ලැබියයුතු රු.110,000 ක ආදායමක් අයකරගැනීමට පියවර ගෙන නොතිබුණි. | මුදල ගෙවනලෙස ආයතනය දැනුවත්කර ඇත. | හිඟ ආදායම් අයකරගැනීමට නොපමාව කටයුතු කළයුතු වේ. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය සහ සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

3.1. **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

-----------------------------------

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අක්කර 12 ක සනීපාරක්ෂක කසළ රඳවන ව්‍යාපෘතියක් ඉදිකිරීම සඳහා 2010 අගෝස්තු 03 දින මධ්‍යම පරිසර අධිකාරිය හා දොම්පෙ ප්‍රාදේශීය සභාව අතර, ඇතිකරගෙන තිබුණ ගිවිසුමේ 1.5 කොන්දේසියට අනුව ඉදිකිරීම් කටයුතු නිමකිරීමෙන් පසු ව්‍යාපෘති භූමිය හා ඉදිකිරීම් දොම්පෙ ප්‍රාදේශීය සභාව වෙත විධිමත්ව පවරාදීමට කටයුතු කළයුතු වුවත් ව්‍යාපෘතියේ ඉදිකිරීම් 2014 වර්ෂය අවසානයේ අවසන්වී තිබුණද, එය පවරා දීමට කටයුතු කර නොතිබුණි. ප්‍රාදේශිය සභාවේ කසළ | මධ්‍යම පරිසර අධිකාරිය විසින් විධිමත් පවරා දීමක් දොම්පෙ ප්‍රාදේශීය සභාව වෙත සිදු නොකෙරුණු බැවින්, ඍජුවම මධ්‍යම පරිසර අධිකාරිය වෙත හා අනුශාංගික වෙනත් දෙපාර්තමේන්තු හා ප්‍රදේශය නියෝජනය කරන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හරහාද අදාල පාර්ශව විධිමත්ව දැනුවත් කිරීමට දොම්පෙ ප්‍රාදේශීය සභාව කටයුතු කර ඇතමෙ සම්බන්ධව ආණ්ඩුකාරතුමා . සහ අදාල නිළධාරීන් සමග විශේෂ සාකච්ඡාවක්ද පැවතුන අතර,එහිදී ද ස්ථිර විසඳුමක් ලබා ගැනීමට හැකියාවක් | ගිවිසුම් ප්‍රකාරව සභාව වෙත පවරා ගතයුතු වේ |

මෙම කසල රඳවනයට දැමීම සිදු කරන අතර මේ සඳහා ට්‍රැක්ටර් හා කම්පැක්ටර් යන්ත්‍ර 6 සහ සේවකයින් 25 ක් යෙදවීමටත් සිදුව තිබෙන බවත් 2020 වර්ෂයේ මේ සඳහා රු 54,937,000 ක වියදමත් දැරීමට සිදුව තිබෙන බවත් තවද වසර 6 ක පමණ කාලයක් සඳහා සභාවට ලබාගත හැකිව තිබූ ආදායම් අහිමිවී තිබෙන බවත් නිරීක්ෂණය විය. කසල රඳවනයේ අපේක්ෂිත අරමුණු වලට ළඟාවී නොමැති බැවින් පවරාදීමේ හැකියාවක් නොමැති බව මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ විසින් පවරා නොදීමට හේතු ලෙස දන්වා ඇත.

නොලැබුණි .